# 5 ශ්‍රේණිය සිංහල

# ගුරු අත් පොතට

# වැඩ පොත - අංක 06

**L4 S4 R4 W4**

**නිපුණතා ආවරණය - 2021**



1. උපදෙස් කියවා නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.
2. ප්‍රවෘත්ති වලට සවන් දී එහි අන්තර්ගත කරුණු කෙටියෙන් ප්‍රකාශ කරයි.
3. නිවේදනයකට සවන් දී එහි වැදගත් කරුණු නිවැරදි ව ඉදිරිපත් කරයි.
4. ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
5. නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
6. විස්තර කථනයකට සවන් දී ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_4$ $S_4$ $R_4$ $W_4$ ඉගෙනුම් පල

- උපදෙස් කියවා නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.
- ප්‍රවෘත්තිවලට සවන් දී එහි අන්තර්ගත කරුණු කෙටියෙන් ප්‍රකාශ කරයි.
- නිවේදනයකට සවන් දී එහි වැදගත් කරුණු නිවැරදි ව ඉදිරිපත් කරයි.
- ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිවේදන ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- විස්තර කථනයකට සවන් දී ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

## උපදෙස්.

- පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදා වාක්‍ය නැවත ලියන්න.

1. මම පාසල් යමි

.......................................................................................................................................

2. පුතේ මෙහාට එන්න යැයි තාත්තා කිවුවේ ය

.......................................................................................................................................

3. වැටකොළු වට්ටක්කා කැරට් සහ බෝංචි වෙන් වෙන් ව අසුරන්න

.......................................................................................................................................

- පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ඡේදයෙන් තෝරා, දී ඇති තිත් ඉරි මත ලියන්න.

> අපි හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට ළඟා වීමු. මේ වර අප ඔරුව නැවැත්වූයේ පළමු දෙවාරයෙහි ම නැවැත්වූ තැනට වඩා හොඳ තැනක ය. ගල්කුළු කිහිපයක් ඇති ඒ ගං ඉවුර මඩවළක් නොවී ය. දිග බොරු කකුල් රාශියක් වැනි මුල්වලින් නැඟී සිටි කඩොල් ගස් පෙළ දූපත වටා යාමට තනන ලද පාලමක් වැන්න. අපි ඔරුවෙන් බැස ඔරුවේ තිබුණු සියලු දේ ගෙන ඔරුව ද ගොඩට ඇද්දෙමු. ඉවුරට මඳක් ඈතින් තිබුණු ලී කොට තුනක් පෙරළා තබා එහි ගල් දමා තළා තොටුපළක් ද සැදුවෙමු.
>
> මඩොල් දූව,
>
> මාර්ටින් වික්‍රමසිංහ

1. ඔරුව ළඟා වූයේ දූපතෙහි කුමන පැත්තකට ද ?

.......................................................................................................................................

2. ගං ඉවුරේ තිබුණේ මොනවා ද ?

.......................................................................................................................................

3. ඡේදයට අනුව කඩොල් ගස් පෙළ හඳුන්වා ඇත්තේ කෙසේ ද ?

.......................................................................................................................................

4. ඔරුව ගොඩට ඇදීමට පෙර කළේ කුමක් ද ?

.......................................................................................................................................

5. තොටුපළ සැදූ ආකාරය ලියා දක්වන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

- ඡේදය කියවා පහත සඳහන් ප්‍රකාශ හරි නම් √ ලකුණ ද, වැරදි නම් X ලකුණ ද යොදන්න.
  1. තුන් පැයක් පමණ යාත්‍රා කොට දූපතට ළ!ගා වීමු. ( )
  2. මෙවර ඔරුව නැවැත්වූයේ වඩා හොඳ තැනක ය. ( )
  3. ගල්කු!ළු කිහිපයක් ඇති ගං ඉවුරේ මඩවලක් වී ය. ( )
  4. කඩොල් ගස් පෙළ දූපතට යෑමට සැදූ තොටුපළක් වැනි ය. ( )
  5. තොටුපළ සැදුවේ ලී කොට තුනක් පෙරළා ගල් දමා තැළීමෙනි. ( )

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.
  1. හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ ....................................................
     (දකුණු පැත්තට ළඟා වීමු./වම් පැත්තට ළඟා වීමු.)
  2. ඔරුව නැවැත්වූයේ පළමු දෙවාරයෙහි ම නැවැත්වූ තැනට වඩා ....................................
     (නරක තැනක ය./හොඳ තැනක ය.)
  3. දිග බොරු කකුල් රුසක් මෙන් වූයේ ....................................................
     (මාර ගස් පෙළ ය./කඩොල් ගස් පෙළ ය.)
  4. ඔරුවේ තිබුණු සියලු දේ ගෙන ඔරුව ....................................................
     (ගොඩට ඇද්දෙමු./යාත්‍රා කළෙමු.)
  5. ලී කොට තුනක් පෙරළා ගල් දමා තළා ....................................................
     (පාලමක් සැදුවෙමු./තොටුපළක් සැදුවෙමු.)

- පහත සඳහන් වාක්‍ය නිවැරදි අනුපිළිවෙළට ගළපා නැවත ලියන්න.
  - ඔරුව නැවැත්වූයේ වඩා හොඳ තැනක ය.
  - ගල්කුළු කිහිපයක් ඇති ගං ඉවුරෙහි මඩවලක් නොවී ය.
  - ඔරුව තුළ තිබූ දේවල් ගෙන ඔරුව ගොඩට ඇද්දෙමු.
  - ඔරුව දූපතේ දකුණු පැත්තට ළඟා විය.
  - ලී කොට තුනක් පෙරළා ගල් දමා තළා තොටුපළක් සැදුවෙමු.
  - කඩොල් ගස් පෙළ දූපත වටා යෑමට තැනූ පාලමක් මෙනි.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

- පහත සඳහන් වචන ගළපා වාක්‍ය සකස් කර තිත් ඉරි මත ලියන්න.
  1. දකුණු / ළඟා විය. / දූපතේ /පැත්තට /ඔරුව

     ....................................................................................................
  2. වඩා / ඔරුව / හොඳ / නැවැත්වූයේ / තැනක ය.

     ....................................................................................................
  3. නොවී ය. / ගං / මඩවලක් / ඉවුරෙහි

     ....................................................................................................
  4. පාලමක් / කඩොල් / පෙළ/ වැන්න. / ගස්

     ....................................................................................................

5. තොටුපළක් / ලී කොට / ගල්/ දමා / තබා / සෑදුවෙමු.

.......................................................................................................................................

උපදෙස්.

- පහත සඳහන් ප්‍රවෘත්ති ප්‍රකාශයේ අන්තර්ගතය කියවා ප්‍රශ්නවලට පිළිතුරු

ආයුබෝවන්
මේ කලණ ළමා රූපවාහිනී සේවය යි.

ප්‍රවෘත්ති ප්‍රකාශය

ඉදිරිපත් කිරීම .......................

මුලින් ම සිරස්තල

- ක්ෂණික ආහාර භාවිතයෙන් වළකින ලෙස වෛද්‍යවරු පවසති.
- කසළ කළමනාකරණය සඳහා තිරසර විසඳුමක අවශ්‍යතාව මතු වෙයි.
- ලෝක වැඩිහිටි දිනය සැමරෙයි.
- ජොහාන් පීරිස් මහතා එවරස්ට් කන්ද තරණය කළ දෙවන ශ්‍රී ලාංකිකයා බවට පත් වෙයි.

- වර්තමානයේ දී ක්ෂණික ආහාර භාවිතය දරුවන් අතර බහුල වී ඇත. ඉතා ම කෙටි කාලයක් තුළ දී පිළියෙල කර ගත හැකි මෙම ආහාර අතර ඇති නූඩ්ල්ස්, සිසිල් බීම, සොසේජස් වැනි ආහාර ගැනීමට ළමයි කැමැත්තක් දක්වති. ක්ෂණික ආහාර ගැනීම නිසා දරුවන්ගේ ශරීර ශක්තිය අඩු වීම, මතක ශක්තිය අඩු වීම ආදිය සිදු වන අතර එමගින් විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම ද සිදු වේ. ශරීරයට අවශ්‍ය පෝෂණය ක්ෂණික ආහාරවලින් ලබා ගත නොහැකි අතර එමගින් ලැබෙන්නේ ක්ෂණික ශක්තියක් පමණි.
මේ නිසා වෙළඳ පොළේ ඇති ක්ෂණික ආහාර දරුවන්ට ලබා දීමෙන් වළකින ලෙස වෛද්‍යවරු පවසති.

- ශ්‍රී ලංකාවේ කසළ අර්බුදයට තිරසර විසඳුමක් මේ වන විට අවශ්‍ය වී ඇත. මේ සඳහා විවිධ අංශවලින් සාකච්ඡා කරනු ලැබුව ද ස්ථිර විසඳුමක් මේ වනතුරුත් ගෙන නොමැත. කසළ කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකු බී.බී.සී. සිංහල සේවය වෙත අදහස් දක්වමින් පවසා සිටියේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වන වැදගත් ම මුල් ම අඩියර ආරම්භ විය යුත්තේ තම නිවසින් බව යි. ඉවත දමන ආහාර ද්‍රව්‍ය, කාඩ්බෝඩ්, පොලිතීන්, වීදුරු වැනි දේ සෙසු ද්‍රව්‍යවලින් වෙන් කර තැබීම පළමු ව කළ යුතු බවත් මුළුතැන්ගෙයි ඉතුරු වන පිසූ ආහාර සහ නොපිසූ ආහාර කොම්පෝස්ට් බඳුන්වල දැමිය යුතු බවත් ඔහු පවසයි.

- සැම වසරක ම ඔක්තෝබර් පළමුවෙනිදාට ලෝක වැඩිහිටි දිනය යෙදෙයි. වර්තමානය වන විට වැඩිහිටියන්ට සැලකීම ක්‍රමයෙන් අඩු වෙමින් පවතින බව පැහැදිලි ව පෙනෙන තත්ත්වයකි. නිවසේ දී වැඩිහිටියන්ට නොසැලකීම, මහ මඟ දමා යෑම, වැඩිහිටි නිවාසවලට යොමු කිරීම ආදිය පිළිබඳ නිරන්තරයෙන් අසන්නට දකින්නට ලැබෙයි. වැඩිහිටියන්ට සැලකීම ආරම්භ කළ යුත්තේ තම නිවසිනි. තමාගේ නිවසේ සිටින වැඩිහිටියන්ට සැලකීම මඟින් සමාජයේ සිටින වැඩිහිටියන්ට කරුණාව දැක්වීමට හැකියාව ලැබෙයි. වැඩිහිටියන්ට සැලකීම වැඩිහිටි දිනයට පමණක් සීමා නොකර, එය තම යුතුකමක් සහ වගකීමක් ලෙස සලකා වැඩිහිටියන්ට සැලකීමට සැම දෙනා අදිටන් කර ගත යුතු ය.

1. ක්ෂණික ආහාර වර්ග කිහිපයක් නම් කරන්න.

.......................................................................................................................................

2. කසළ කළමනාකරණයට මුල් අඩිතාලම ආරම්භ කළ යුත්තේ කොතැනින් ද ?

.......................................................................................................................................

3. වැඩිහිටි දිනය යෙදී ඇත්තේ කවර දාට ද ?

.......................................................................................................................................

4. එවරස්ට් කන්ද තරණය කළ දෙවන ශ්‍රී ලාංකිකයා කවරෙක් ද ?

.......................................................................................................................................

6. ප්‍රවෘත්ති ප්‍රකාශයක් කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

## <u>නිවේදන</u>

- පහත සඳහන් නිවේදනය කියවා පිළිතුරු ලියන්න.

අප පාසලේ පස් වන ශ්‍රේණියේ සිසුසිසුවියන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයක් පැවැත්වීමට 'ප්‍රභාවී' කලාකවය කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා චිත්‍ර, අත්කම්, කවි, ගීත, කතන්දර ඇතුළත් නිර්මාණ ඉදිරිපත් කළ හැකි බව 'ප්‍රභාවී' කලාකවය දන්වා සිටියි. ප්‍රදර්ශනය සඳහා ඔබ ඉදිරිපත් කරන නිර්මාණ ඔබගේ ම නිර්මාණ බවට පන්තිභාර ගුරුවරයා සහතික කළ යුතු ය. සියලු ම නිර්මාණ සැප්තැම්බර් මස 15 දිනට පෙර භාර දිය යුතු ය. නිර්මාණ ඉදිරිපත් කරන සැම සිසුවෙකුට ම සහතික පත්‍රයක් ද ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග පිරිනැමීමට ද 'ප්‍රභාවී' කලාකවය සැලසුම් කර ඇත. "ප්‍රභාවී" නිර්මාණ ප්‍රදර්ශනය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය සැප්තැම්බර් මස 30 දින පෙ.ව.9.00ට පාසල් පරිශ්‍රයේ දී පැවැත්වීමට නියමිත ය.

1. නිර්මාණ ප්‍රදර්ශනය පවත්වන්නේ කුමන ශ්‍රේණියක සිසුන්ගේ සහභාගිත්වයෙන් ද?

.......................................................................................................................................

2. නිර්මාණ ප්‍රදර්ශනය සංවිධානය කරන්නේ කවරෙක් ද ?

.......................................................................................................................................

3. නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ හැකි දේවල් මොනවා ද ?

.......................................................................................................................................

4. නිර්මාණ සහතික කළ යුත්තේ කවරෙක් ද ?

.......................................................................................................................................

5. නිර්මාණ භාර ගන්නා අවසන් දිනය කවරදා ද ?

.......................................................................................................................................

6. නිර්මාණ ඉදිරිපත් කරන සැම සිසුවෙකුට ම ලබා දෙන්නේ මොනවා ද ?

.......................................................................................................................................

7. ජයග්‍රාහක-ජයග්‍රාහිකාවන්ට ලබා දීමට සැලසුම් කර ඇත්තේ මොනවා ද ?

.......................................................................................................................................

8. නිර්මාණ ප්‍රදර්ශනය පැවැත්වෙන්නේ කොහේ ද ?

.......................................................................................................................................

9. නිවේදනයක් ඉදිරිපත් කරන ශෛලියෙන් පහත සඳහන් නිවේදන ඉදිරිපත් කරන්න.

විද්‍යාලයීය දූ පුතුන්ගේ කලා කුසලතා එළි දක්වන 'රඟන රැඟුම්' විවිධ ප්‍රසංගය මෙවරත් උත්කර්ෂවත් අයුරින් 2020 දෙසැම්බර් මස 05 දින ප.ව.2.00ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. පාසලේ සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගිත්වයෙන් විවිධ ප්‍රසංගය හැඩ ගැන්වීමට නියමිත ය. එය නැරඹීම සඳහා සියලු ම දෙමව්පියන්ට සහ ආදි ශිෂ්‍යශිෂ්‍යාවන්ට ඇරයුම් කරන අතර ප.ව.1.00 වන විට පාසලේ ප්‍රධාන ශාලාවේ අසුන් ගන්නා ලෙසට දැනුම් දී සිටිමු.

පාසලේ පුස්තකාල සංගමය හොඳ ම පාඨකයන් තේරීමේ තරගාවලියක් පැවැත්වීමට අදහස් කර ඇත. සාහිත්‍ය මාසය අරමුණු කර ගනිමින් මෙම තරගාවලිය පැවැත්වීමට බලාපොරොත්තු වේ. වර්ෂය පුරා වැඩි ම පොත් සංඛ්‍යාවක් කියවූ ශිෂ්‍යශිෂ්‍යාවන් ශ්‍රේණි මට්ටමින් තෝරා ත්‍යාග පිරිනැමීමට නියමිත ය. එක් එක් ශ්‍රේණියට අදාළ ව නිර්දේශ කරන ලද පොත් ඇසුරෙන් ශ්‍රේණි මට්ටමින් ලබා දෙන දැනුම මිනුම ප්‍රශ්නාවලියකට පිළිතුරු ලබා දීමෙන් හොඳ ම පාඨකයන් තෝරා ගැනීම විධිමත් ව සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

යටිනුවර අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් එකමුතුවෙන් බාල දක්ෂ කඳවුරක් පරාක්‍රම මහා විද්‍යාලයේ දී පැවැත්වේ. 2020 ජුනි මස 01 හා 02 යන දිනවල කඳවුර පැවැත්වීමට නියමිත ය. සෑම පාසලක ම බාල දක්ෂයන් මේ සඳහා සහභාගි කරවිය යුතු අතර සිසුන් සමග ගුරුවරයකු ද සහභාගි විය යුතු ය. සිසුන්ට අවශ්‍ය ආහාරපාන ඒ ඒ පාසල්වලින් සපයා ගැනීමට කටයුතු කළ යුතු ය. කඳවුර පැවැත්වෙන දින දෙකේ ම පෙ.ව. 8.00ට පරාක්‍රම මහා විද්‍යාලයට පැමිණිය යුතු අතර කඳවුර අවසන් වන වේලාව වන ප.ව.4.00 වන තෙක් රැඳී සිටිය යුතු ය.

## විස්තර කථන

- යම් අවස්ථාවක්, සිද්ධියක් දෙස බලා සිට ඒ පිළිබඳ ව විස්තර කර දීම විස්තර කථනයක් ලෙස හඳුන්වා දිය හැකිය.

  උදා : – ක්‍රිකට්, ෆුට්බෝල් වැනි ක්‍රීඩා පැවැත්වෙන අවස්ථාවක්
  පාසලේ පැවැත්වෙන ක්‍රීඩා උත්සවයක් . . . ආදිය.

- පහත සඳහන් විස්තර කථනය කියවා පිළිතුරු ලියන්න.

මේ අවස්ථාවේ දී පිටියේ ක්‍රියාත්මක වන්නේ බාලිකා මීටර් සියය දුර දිවීමේ තරගය යි. ඒ සඳහා පළමු වන මංතීරුවේ සූර නිවාසය නියෝජනය කරමින් අංක 03 පැළඳගෙන කාව්‍යා නෙත්මිණි ද, දෙවන මංතීරුවේ ධීර නිවාසය නියෝජනය කරමින් අංක 02 පැළඳගෙන කලණි මේනකා ද, තුන් වන මංතීරුවේ වීර නිවාසය නියෝජනය කරමින් අංක 01 පැළඳගෙන සචිනි උත්පලා ද, තරග ආරම්භ කිරීමට සූදානම් ව සිටිනවා. විනිශ්චය මණ්ඩලය ලෙස නිමල් සමරතුංග මහතාත්, පවනි අමරසූරිය මහත්මිය සහ කමල් ගුණතිලක මහතාත් කටයුතු කරනවා.

ඔව් . . . දැන් තරගය ආරම්භ කිරීමට සූදානම්. ප්‍රධාන විනිසුරු විසින් ආරම්භක සංඥාව දෙනු ලබනවා. තරගකාරී ක්‍රීඩිකාවන් තිදෙනා ම පවනට බඳු වේගයෙන් දිව යනවා. නිවාසවල සියලු දෙනා ම නැඟී සිට, ඔල්වරසන් දෙමින් තමතමන්ගේ තරගකාරියන් උනන්දු කරවනවා.

ඉදිරියෙන් ම දිව යන්නේ ධීර නිවාසයේ කලණි මේනකා යි. ඒ වගේ ම සූර නිවාසයේ කාව්‍යා නෙත්මිණි ද කරට කර තරගයක් ලබා දෙනවා. කෙසේ නමුත් මේ දැන් තරගය අවසන් වනවා. ජයග්‍රාහී ස්ථානය පසු කරමින් ජයග්‍රහණය ලබා ගන්නේ ධීර නිවාසයේ කලණි මේනකා යි. ඒ අනුව මෙවර නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ බාලිකා මීටර් සියය තරගයෙන් ප්‍රථම ස්ථානය ධීර නිවාසයේ කලණි මේනකා විසින් දිනා ගනු ලබනවා.

1. පිටියේ ක්‍රියාත්මක වූ තරග ඉසව්ව කුමක් ද ?

.......................................................................................................

2. තරගය සඳහා සහභාගි වූ නිවාසවල නම් මොනවා ද ?

.......................................................................................................

3. තරග විනිශ්චය සඳහා කී දෙනෙකු සහභාගි වූවා ද ?

.......................................................................................................

4. තරග අවස්ථාවේ දී නිවාසවල සිටි අනෙකුත් සිසුසිසුවියන් කුමක් කළා ද ?

.......................................................................................................

5. තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්තේ කවරෙක් ද ?

.......................................................................................................

- ඔබ කැමති යම් අවස්ථාවක්, සිද්ධියක් පිළිබඳ ව කෙටි විස්තර කථනයක් ලියන්න.

  උදා : – ක්‍රිකට්, ෆුට්බෝල් වැනි ක්‍රීඩා පැවැත්වෙන අවස්ථාවක්
  පාසලේ පැවැත්වෙන ක්‍රීඩා උත්සවයක්
  ගොඩනැඟිල්ලක් විවෘත කිරීමක්
  පොළක්, පෙරහැරක් . . . ආදිය.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................